**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**

**ආපනශාලා, සුබසාධන වෙළඳසැල්, ඡායා පිටපත් හා ලිපිද්‍රව්‍ය වෙළෙඳසල් පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම 2024/2025**

මෙම විශ්වවිද්‍යාලයට අයත් පහත සඳහන් ආපනශාලා, සුබසාධන වෙළඳසැල්, ඡායා පිටපත් හා ලිපිද්‍රව්‍ය වෙළෙඳසැල් පවත්වාගෙන යෑම සඳහා පළපුරුදු පුද්ගලයින්ගෙන් හා ආයතන වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

1. සිංහරාජ නේවාසිකාගාර ආපනශාලාව
2. ප්‍රධාන ශිෂ්‍ය ආපනශාලාව
3. නව වලව නේවාසිකාගාර ආපනශාලාව
4. කැෆටේරියා ආපනශාලාව
5. කෘෂිවිද්‍යාපීඨ ආපනශාලාව
6. කාර්යමණ්ඩල ආපනශාලාව
7. සමණළ නේවාසිකාගාර ආපනශාලාව
8. කළමනාකරණ පීඨ සුබසාධන වෙළඳසැල
9. සමාජීය විද්‍යා හා භාෂාපීඨ සුබසාධන වෙළඳසැල
10. ව්‍යවහාරික විද්‍යා පීඨ සුබසාධන වෙළඳසැල
11. තාක්ෂණ පීඨ සුබසාධන වෙළඳසැල
12. කළමනාකරණ පීඨ ඡායා පිටපත් හා ලිපිද්‍රව්‍ය වෙළෙඳසල
13. කෘෂිවිද්‍යාපීඨ ඡායා පිටපත් හා ලිපිද්‍රව්‍ය වෙළෙඳසල
14. ව්‍යවහාරික විද්‍යා පීඨ ඡායා පිටපත් හා ලිපිද්‍රව්‍ය වෙළෙඳසල
15. වෛද්‍ය පීඨ ආපනශාලාව (බටුහේන)
16. වෛද්‍ය පීඨ ඡායා පිටපත් හා ලිපිද්‍රව්‍ය වෙළෙඳසල(බටුහේන)
17. වෛද්‍ය පීඨ ආපනශාලාව (ගල්කඩුවවත්ත)

ලංසු ලේඛණ (1 සිට 14 දක්වා ආපනශාලා/ සුබසාධන වෙළඳසැල්/ ඡායා පිටපත් හා ලිපිද්‍රව්‍ය වෙළෙඳසල් සඳහා සිංහල භාෂාවෙන්) ආපසු ගෙවනු නොලබන රු. 500.00 ක මුදලක් ලංසු ගාස්තු වශයෙන් මෙම විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් රිසිට්පත 2023.12.21 දින සිට 2024.01.11 දින දක්වා රජයේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට 3.00 දක්වා කාලයතුල දී ජ්‍යේෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/අධ්‍යයන හා ශිෂ්‍ය සේවා වෙත ඉදිරිපත් කිරීමෙන් ලබා ගත හැකි ය. වෛද්‍ය පීඨයට අදාළ (අංක 15,16 හා 17 සිංහලෙන්) සඳහා ලංසු ලේඛණ රත්නපුර ගල්කඩුවවත්ත පරිශ්‍රයේ ඇති ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨ පීඨාධිපති කාර්යාලයෙන් ආපසු ගෙවනු නොලබන රු. 500.00 ක මුදලක් ලංසු ගාස්තු වශයෙන් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ලංකා බැංකු ගිණුම් අංක 2246976 ට බැර කරන ලද රිසිට්පත ලබා දීමෙන් ලබාගත හැක.

සම්පූර්ණ කරන ලද මුද්‍රා තැබූ ලංසුපත් ජ්‍යේෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/අධ්‍යයන හා ශිෂ්‍ය සේවා, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ.පෙ. 02, බෙලිහුල්ඔය යන ලිපිනයට 2024.01.12 දින ප.ව. 3.00 හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් බාරදීම කළ යුතු ය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ආපනශාලාවේ නම/සුබසාධන වෙළඳසැලේ නම / ඡායා පිටපත් හා ලිපිද්‍රව්‍ය වෙළෙඳසලේ නම සඳහන් කළ යුතු ය.

ලංසු විවෘත කිරීම 2024.01.12 දින ප.ව. 3.15 ට ජ්‍යේෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/අධ්‍යයන හා ශිෂ්‍ය සේවා කාර්යාලයේ දී සිදු කරනු ලැබේ. මෙම අවස්ථාවට ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකි ය.

මේ පිළිබඳ විශ්වවිද්‍යාලයෙහි ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වන අතර ප්‍රසම්පාදනයේ කිසිදු අදියරකට බලපෑම් එල්ල කිරීම සපුරා තහනම් වේ.

ලේඛකාධිකාරි
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය,
තැ.පෙ. 02,
බෙලිහුල්ඔය

2023.12.21